<<<<<<<<<< බහුවරණ >>>>>>>>>>

1: පරිගණකයකට දත්ත සහ උපදෙස් ලබා දෙන විට ඒවා තේරුම් ගන්නේ කෙසේද?

1. මිනිසාට හුරුපුරුදු භාෂාවෙන්
2. සංඛ්‍යාත්මක අගයන් ලෙස
3. රූප සහ ශබ්ද ලෙස
4. කෙටි පණිවිඩ ලෙස

2)"Bit" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

1. Binary text
2. Binary digit
3. Binary image
4. Binary tool

3)පරිගණකයක් "ON" සහ "OFF" යන අවස්ථාවන් නිරූපණය කිරීමට භාවිතා කරන සංකේත මොනවාද?

1. ON - A, OFF - B
2. ON - 1, OFF - 0
3. ON - 0, OFF - 1
4. ON - True, OFF – False

4)පරිගණක පද්ධතියක දත්ත ආදානය, සැකසීම සහ ප්‍රතිදානය සිදුවන මූලික ක්‍රියාවලිය කුමක්ද?

1. දශම ආකාරයෙන් දත්ත ගෙන එය එලෙසම ප්‍රතිදානය කිරීම
2. පෙළ ආකාරයෙන් දත්ත ගෙන එය ශබ්ද ලෙස ප්‍රතිදානය කිරීම
3. ආදාන දත්ත ද්විමය ආකාරයට ගෙන, ද්විමය ලෙස සකසා, නැවතත් පෙළ, රූප, ශබ්ද ලෙස ප්‍රතිදානය කිරීම
4. රූප ආකාරයෙන් දත්ත ගෙන එය දශම ආකාරයට සැකසීම

5)සංඛ්‍යාවක පාදය (base) දැක්වීමට භාවිතා කරන්නේ කෙසේද?

1. සංඛ්‍යාවට ඉහළින්
2. සංඛ්‍යාවට වම් පසින්
3. සංඛ්‍යාවේ දකුණු පස පහළින්
4. සංඛ්‍යාවට මැදින්

6)පරිගණකයක් සඳහා දිනය, වේලා කලාපය, වේලාව, මුදල් ඒකක සහ සංඛ්‍යා ආකෘති නිවැරදිව සකස් කිරීමේ වැදගත්කමක් ලෙස සඳහන් නොවන කරුණ කුමක්ද?

1. මෘදුකාංග ස්ථාපනය සහ යාවත්කාලීන කිරීම
2. මෘදුකාංග බලපත්‍ර සක්‍රීය කිරීම
3. පරිගණකයේ ක්‍රියාකාරී වේගය වැඩි කිරීම
4. මෙහෙයුම් පද්ධතිය යාවත්කාලීන කිරීම

7)මොනිටරයක් පරිගණකයට සම්බන්ධ කිරීම සඳහා භාවිතා කළ හැකි ports වර්ග මොනවාද?

1. PS2, USB
2. RJ45, eSATA
3. VGA, DVI, HDMI
4. HD Audio, Micro USB

8)පරිගණක වෛරසයක් යනු කුමක්ද?

1. පරිගණක පද්ධතියට හානි කරන, දත්ත විනාශ කරන සහ වෛරස පිටපත් ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව ඇති අනිෂ්ට කේතයකි.
2. පරිගණකයට අහිතකර බලපෑම් ඇති කරන මෘදුකාංග දෝෂයකි.
3. පරිගණකයේ ක්‍රියාකාරීත්වය මන්දගාමී කරන දෘඩාංග දෝෂයකි.
4. අන්තර්ජාලය හරහා පැතිරෙන අනවශ්‍ය වෙළඳ දැන්වීම් පද්ධතියකි.

9)පරිගණකයක දෘඩාංග දෝෂයක් (Hardware fault) ලෙස සැලකිය නොහැකි තත්ත්වය කුමක්ද?

1. නාදකය (speakers) ක්‍රියාත්මක නොවීම
2. ජාලයට සම්බන්ධ නොවීම
3. යෙදුම් මෘදුකාංගයක් (application software) විවෘත නොවීම
4. මොනිටරය ක්‍රියාත්මක නොවීම

10)පරිගණකයක Micro USB port එක සාමාන්‍යයෙන් භාවිතා කරන්නේ කුමන වර්ගයේ උපාංග සම්බන්ධ කිරීමටද?

1. මොනිටර
2. මුද්‍රණ යන්ත්‍රය
3. ජංගම දුරකථන, MP3 ප්ලේයර්, ඩිජිටල් කැමරා වැනි කුඩා උපාංග
4. බාහිර දෘඩ තැටිය(External Hard Disk)

11) වදන් සැකසීම (“Word Processing") යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

1. පරිගණක දෘඩාංග ස්ථාපනය කිරීම.
2. වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් ලේඛන නිර්මාණය කිරීම.
3. පරිගණක ජාලයක් කළමනාකරණය කිරීම.
4. දත්ත සමුදායන් නිර්මාණය කිරීම.

12)ලේඛනයක පෙළක් මධ්‍යයට පෙළගැස්වීම (Center Alignment) සඳහා භාවිතා කරන මෙවලම කුමක්ද?

1. Align Left
2. Align Right
3. Center
4. Justify

13)ලේඛනයකට රූප, වගු, හැඩතල (Shapes), Text Boxes ඇතුළු කිරීමට භාවිතා කරන පොදු මෙවලම කුමක්ද?

1. Edit
2. Format
3. Insert Objects
4. View

14)"Spelling and Grammar" මෙවලම අයත් වන්නේ කුමන වර්ගයේ මෙවලම් කාණ්ඩයටද?

1. පෙළ හැඩතල ගැන්වීමේ මෙවලම්
2. පෙළ පෙළගැස්වීමේ මෙවලම්
3. පොදු මෙවලම්
4. වස්තු ඇතුළත් කිරීමේ මෙවලම්

15)වදන් සැකසුම් මෘදුකාංගයක් යනු කුමන වර්ගයේ මෘදුකාංගයක්ද?

1. පද්ධති මෘදුකාංගයකි
2. යෙදුම් මෘදුකාංගයකි
3. මෙහෙයුම් පද්ධතියකි
4. දෘඪාංගයකි

16)ඇල්ගොරිතමයක් ගොඩනැගීමේදී භාවිතා වන ප්‍රධාන පාලන ව්‍යුහයන් (control structures) මොනවාද?

1. අනුපිළිවෙල (Sequence), තේරීම (Selection), පුනරාවර්තනය (Repetition)
2. ඇතුළත් කිරීම (Input), සැකසීම (Process), ප්‍රතිදානය (Output)
3. ආරම්භය (Start), අවසානය (End), ක්‍රියාකාරීත්වය (Action)
4. සසඳා බැලීම (Comparison), තර්කනය (Logical), කොන්දේසි (Conditions)

17)"අනුපිළිවෙල" (Sequence) පාලන ව්‍යුහය නිරූපණය කරන නිවැරදි අර්ථ දැක්වීම කුමක්ද?

1. ඇල්ගොරිතමයක සියලුම පියවර ආරම්භයේ සිට අවසානය දක්වා අනුපිළිවෙලින් ක්‍රියාත්මක වීම.
2. කොන්දේසි මත පදනම්ව පියවර තෝරා ගැනීම.
3. යම් ක්‍රියාවක් නැවත නැවත සිදු කිරීම.
4. දත්ත සැකසීම පමණක් සිදු කිරීම.

18)Scratch වැඩසටහන්කරණයේදී "IF... THEN" block එක භාවිතා කරන්නේ කුමන අවස්ථාවකදීද?

1. කොන්දේසිය සත්‍ය වුවහොත් සහ අසත්‍ය වුවහොත් පියවර දෙකක් ක්‍රියාත්මක කිරීමට.
2. කොන්දේසිය සත්‍ය වුවහොත් පමණක් පියවරක් ක්‍රියාත්මක කිරීමට.
3. අගයන් දෙකක් සංසන්දනය කිරීමට.
4. කිසිම කොන්දේසියක් නොමැතිව පියවරක් ක්‍රියාත්මක කිරීමට.

19)13 MOD 5 හි අගය කුමක්ද?

1. 2
2. 3
3. 5
4. 13

20)Smart Phone එකක භාවිතයක් ලෙස සඳහන් නොවන කරුණ කුමක්ද?

1. දුරකථන සංවාද පැවැත්වීම
2. SMS සහ MMS යැවීම
3. ඩිජිටල් පොත්පත් මුද්‍රණය කිරීම
4. ඡායාරූප ලබා ගැනීම

21) Basic Logic Gates තුන කුමක්ද?

1. AND, OR, XOR
2. NOT, NAND, NOR
3. AND, OR, NOT
4. AND, OR, XNOR

22)ද්වාරයක (NOT Gate) ප්‍රතිදානය (Output) එහි ආදානයට සාපේක්ෂව කෙසේද?

1. ආදානයට සමාන වේ.
2. ආදානයට ප්‍රතිවිරුද්ධ වේ.
3. සෑම විටම 1 වේ.
4. සෑම විටම 0 වේ.

23)ඩිජිටල් සංඥා වල අගයන් සාමාන්‍යයෙන් මොනවාද?

1. HIGH, LOW
2. A, B
3. 0, 1
4. TRUE, FALSE

24)NOT ද්වාරයක් නිරූපණය කරන උපමාවක් ලෙස දැක්විය හැකි උදාහරණය කුමක්ද?

1. එක් ස්විචයකින් පාලනය වන විදුලි බුබුලක්.
2. ස්විච දෙකකින් පාලනය වන විදුලි බුබුලක්.
3. දවල්ට ස්වයංක්‍රීයව ක්‍රියා විරහිත වන අතර රාත්‍රියේදී ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන වීදි ලාම්පුවක්.
4. ජල ටැංකියක ජල මට්ටම පාලනය කරන පද්ධතියක්.

25)Logic Gate වල "සත්‍යතා වගු" (Truth Tables) භාවිතා කරන්නේ කුමන අරමුණක් සඳහාද?

1. ද්වාරයේ භෞතික ව්‍යුහය පෙන්වීමට.

2. ආදාන වලට අදාළව ද්වාරයේ ප්‍රතිදානය කෙසේ වෙනස් වේදැයි දැක්වීමට.
3. ද්වාරයේ අභ්‍යන්තර ව්‍යුහය පෙන්වීමට.
4. ද්වාරයේ ප්‍රමාණය පෙන්වීමට.

26)අන්තර්ජාලයේ තොරතුරු සෙවීම සඳහා භාවිතා කරන ප්‍රධාන මෙවලම් මොනවාද?

1. සෙවුම් යන්ත්‍ර (Search Engines)
2. විද්‍යුත් තැපෑල (Email)
3. වදන් සැකසුම් මෘදුකාංග
4. දත්ත සමුදායන්

27)වෙබ් පිටුවක ඇති "අධි සබැඳියක්" (Hyperlink) සාමාන්‍යයෙන් හඳුනා ගන්නේ කෙසේද?

1. එය සාමාන්‍ය පෙළට වඩා විශාල අකුරින් තිබීම.
2. එය යටින් ඉරක් ඇඳී, වෙනස් වර්ණයකින් තිබීම සහ මූසිකය ඒ මතට ගෙන යන විට අතක රූපයක් දිස්වීම.
3. එය රූපයක් ලෙස තිබීම.
4. එය පිටුවේ ඉහළින්ම තිබීම.

28)වෙබ් පිටු නිර්මාණය කිරීම සඳහා භාවිතා කරන මූලික මෙවලමක් (Tool) ලෙස සැලකිය හැක්කේ කුමක්ද?

1. Microsoft Word
2. HyperText Markup Language
3. Adobe Photoshop
4. Microsoft Excel

29)වෙබ් පිටුවකට රූපයක් ඇතුළත් කිරීම සඳහා භාවිතා කරන HTML ටැගය කුමක්ද?

1. <link href=”…”>
2. <image src=”….”>
3. <img src=”….”>
4. <image link=”…”>

30)වෙබ් පිටුවක නව පේළියක් ආරම්භ කිරීමට (Line Break) භාවිතා කරන HTML උසුලන කුමක්ද?

1. <p>
2. <b>
3.
4. <h1>

31)වෙබ් පිටු නිර්මාණය කිරීමේදී උසුලන (Tags/Elements) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

1. වෙබ් පිටුවේ වර්ණ.

2. වෙබ් පිටුවේ පින්තූර.
3. වෙබ් පිටුවක කොටස් ව්‍යුහගත කිරීමට භාවිතා කරන < > වැනි සලකුණු සහිත කේත.
4. වෙබ් පිටුවේ ඇති පෙළ.

32)වෙබ් පිටුවක් නිර්මාණය කිරීමේදී "Navigation" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

1. වෙබ් පිටුවේ පින්තූර ඇතුළත් කිරීම.
2. වෙබ් පිටුවේ අකුරු ප්‍රමාණය වෙනස් කිරීම.
3. භාවිතා කරන්නන් වෙබ් පිටු අතර ගමන් කරන ආකාරය සහ අනෙකුත් වෙබ් පිටු සමඟ ඇති සම්බන්ධතා.
4. වෙබ් පිටුවේ වර්ණ තෝරා ගැනීම.

33)HTML ටැගයක් සඳහා උදාහරණයක් නොවන දේ කුමක්ද?

1. <html>
2. <body>
3. <image>
4. <p>

34)වෙබ් පිටුවක් නිර්මාණය කිරීමේදී, "Images" (රූප) සම්බන්ධයෙන් සැලකිය යුතු කරුණු අතරට ඇතුළත් වන්නේ කුමක්ද?

1. රූප විශාල ප්‍රමාණයක් භාවිතා කිරීම.
2. අන්තර්ගතයට ගැලපෙන, සීමිත රූප සංඛ්‍යාවක් භාවිතා කිරීම.
3. රූපවල වර්ණ සීමා කිරීම.
4. රූපවල ප්‍රමාණය වෙනස් නොකිරීම.

35)දශම සංඛ්‍යා පද්ධතියේ පාදය (base) කීයද?

1. 2
2. 8
3. 10
4. 16

36)පරිගණකයකට ලබා දෙන සියලුම දත්ත පරිගණකය තුළ ගබඩා වන්නේ කෙසේද?

1. දශම (Decimal) ආකාරයෙන්
2. ද්විමය (Binary) ආකාරයෙන්
3. ෂඩ් දශම (Hexadecimal) ආකාරයෙන්
4. අෂ්ටක (Octal) ආකාරයෙන්

37)13_{10} ද්විමය සංඛ්‍යාවට පරිවර්තනය කළ විට ලැබෙන පිළිතුර කුමක්ද?

1. 1011_2
2. 1101_2
3. 1110_2
4. 1001_2

38)පරිගණකයක දීර්ඝ වශයෙන් අක්‍රිය වූ පසු දත්ත ගබඩා වී ඇත්තේ කුමන ආකාරයෙන්ද?

1. පෙළ (Text)
2. ශබ්ද (Audio)
3. ද්විමය (Binary) බිටු අනුපිළිවෙලක් ලෙස
4. දශම (Decimal) ආකාරයෙන්

39)0 සහ 1 යන සංකේත දෙක පමණක් භාවිතා වන සංඛ්‍යා පද්ධතිය කුමක්ද?

1. අෂ්ටක
2. දශම
3. ෂඩ් දශම
4. ද්විමය

40)පරිගණකයකට සපයන රූප (image) දත්ත පරිගණකය තුළ ගබඩා වන්නේ කුමන ආකාරයෙන්ද?

1. රූපයේ වර්ණ ලෙස
2. රූපයේ විශාලත්වය ලෙස
3. ද්විමය බිටු අනුපිළිවෙලක් ලෙස
4. රූපයේ නම ලෙස

41)ගොනු ගුණාංග (file attributes) අතරට අයත් නොවන කරුණ කුමක්ද?

1. ගොනුවේ විශාලත්වය
2. ගොනුවේ අයිතිවාසිකම්
3. ගොනුවේ වර්ණය
4. ගොනුව නිර්මාණය කළ දිනය

42)පරිගණකයක් බලගැන්වීමේදී ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී පළමුව කළ යුතු පරීක්ෂාව කුමක්ද?

1. මොනිටරය වෙනස් කිරීම
2. යතුරුපුවරුව සහ මූසිකය පරීක්ෂා කිරීම
3. විදුලි රැහැන් සහ සම්බන්ධතා නිවැරදි දැයි පරීක්ෂා කිරීම
4. මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කිරීම

43)Windows 10 මෙහෙයුම් පද්ධතියේ Desktop එක හිස්ව පෙනෙන අවස්ථාවකදී, Tablet mode එක සක්‍රීය වී ඇත්නම් එය නිවැරදි කිරීමට කළ යුතු දේ කුමක්ද?

1. Display settings වෙනස් කිරීම
2. PC mode වෙත මාරු කිරීම
3. Show desktop icons Disable කිරීම
4. මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කිරීම

44)පරිගණකයක මෙහෙයුම් පද්ධතිය (Operating System) යාවත්කාලීන කිරීමේ වැදගත්කමට හේතුව කුමක්ද?

1. පරිගණකයේ භෞතික කොටස්වල ආයු කාලය වැඩි කිරීමට
2. මෘදුකාංග බලපත්‍ර සක්‍රීය කිරීම සඳහා අවශ්‍ය වන නිසා
3. පරිගණකයේ වර්ණය වෙනස් කිරීමට
4. පරිගණකයේ බර අඩු කිරීමට

45)පරිගණකයක් මන්දගාමී වීමට හේතු විය හැකි ප්‍රධාන සාධක දෙකක් මොනවාද?

1. මොනිටරයේ ප්‍රමාණය විශාල වීම සහ කථන යන්ත්‍ර සම්බන්ධ කිරීම
2. ආරම්භක වැඩසටහන් (startup programs) විශාල සංඛ්‍යාවක් තිබීම සහ ප්‍රධාන දත්ත ගබඩාව (hard drive) අනවශ්‍ය ගොනු වලින් පිරී තිබීම
3. යතුරුපුවරුව සහ මූසිකය ක්‍රියාත්මක නොවීම
4. අන්තර්ජාල සම්බන්ධතාවය නොමැති වීම

46)වදන් සැකසුම් මෘදුකාංගයක "Cut", "Copy", "Paste", "Undo", "Redo" වැනි මෙවලම් අයත් වන්නේ කුමන වර්ගයටද?

1. පෙළ හැඩතල ගැන්වීමේ මෙවලම්
2. පෙළ පෙළගැස්වීමේ මෙවලම්
3. පොදු මෙවලම්
4. වස්තු ඇතුළත් කිරීමේ මෙවලම්

47)වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් නිර්මාණය කළ හැකි ලේඛන වර්ගයක් නොවන දේ කුමක්ද?

1. පුවත්පත්
2. ආරාධනා පත්‍ර
3. ප්‍රශ්න පත්‍ර
4. පරිගණක මෘදුකාංග

48)වදන් සැකසුම් මෘදුකාංගයක "Print Preview" හි කාර්යය කුමක්ද?

1. ලේඛනය කෙලින්ම මුද්‍රණය කිරීම
2. ලේඛනය මුද්‍රණය කිරීමට පෙර එය කෙසේ දිස්වන්නේදැයි බැලීම
3. ලේඛනයේ අකුරු ප්‍රමාණය වෙනස් කිරීම
4. ලේඛනය සුරැකීම

49)"Subscript" මෙවලම මගින් පෙළක් හැඩතල ගන්වන්නේ කෙසේද?

1. පෙළ සාමාන්‍ය පේළියට පහළින් කුඩා අකුරින් දැක්වීම (උදා: CO_2)
2. පෙළ සාමාන්‍ය පේළියට ඉහළින් කුඩා අකුරින් දැක්වීම (උදා: 2^2)
3. පෙළ සාමාන්‍යයෙන් වඩා විශාල අකුරින් දැක්වීම
4. පෙළෙහි වර්ණය වෙනස් කිරීම

50)"Line and Paragraph Spacing" මෙවලමෙහි කාර්යය කුමක්ද?

1. අකුරු වල ප්‍රමාණය වෙනස් කිරීම
2. අකුරු වල වර්ණය වෙනස් කිරීම
3. පේළි සහ ඡේද අතර පරතරය වෙනස් කිරීම

4. පෙළ යටින් ඉරක් ඇඳීම

51)"තේරීම" (Selection) පාලන ව්‍යුහය යනු කුමක්ද?

1. ඇල්ගොරිතමයක සියලුම පියවර ආරම්භයේ සිට අවසානය දක්වා අනුපිළිවෙලින් ක්‍රියාත්මක වීම.
2. යම් කොන්දේසියක් සත්‍ය වීම හෝ අසත්‍ය වීම මත පදනම්ව ක්‍රියාත්මක කළ යුතු පියවර තෝරා ගැනීම.
3. යම් ක්‍රියාවක් කිහිප වතාවක් නැවත නැවත සිදු කිරීම.
4. දත්ත ඇතුළත් කිරීම, සැකසීම සහ ප්‍රතිඵල ලබා දීම.

52)ගණනය කිරීමේදී "ආදානය", "ක්රියාවලිය", "ප්රතිදානය" යන්නෙහි නිවැරදි අනුපිළිවෙල කුමක්ද?

1. ක්රියාවලිය, ආදානය, ප්රතිදානය
2. ප්රතිදානය, ආදානය, ක්රියාවලිය
3. ආදානය, ක්රියාවලිය, ප්රතිදානය
4. ක්රියාවලිය, ප්රතිදානය, ආදානය

53)Scratch වැඩසටහන්කරණයේ "Logical blocks" වර්ග තුන කුමක්ද?

1. Less than, Equal to, Greater than
2. AND, OR, NOT
3. Input, Process, Output
4. Sequence, Selection, Repetition

54)යම් සංඛ්‍යාවක් ඉරට්ටේ ද ඔත්තේ ද යන්න තීරණය කිරීමට භාවිතා කරන ගණිතමය කාරකය (mathematical operator) කුමක්ද?

1. SUM
2. DIV
3. MOD
4. MULTIPLY

55)සුහුරු උපාංග (Smart Devices) සඳහා උදාහරණයක් නොවන දේ කුමක්ද?

1. Smart Watch
2. Smart TV
3. Desktop Computer
4. Drone Camera

56)Scratch වැඩසටහන්කරණයේදී "IF... THEN... ELSE..." block එක භාවිතා කරන්නේ කුමන අවස්ථාවකදීද?

1. කොන්දේසියක් නොමැතිව පියවරක් ක්‍රියාත්මක කිරීමට.
2. අගයන් දෙකක් සංසන්දනය කිරීමට.
3. කොන්දේසිය සත්‍ය වුවහොත් එක් පියවරක්ද, අසත්‍ය වුවහොත් තවත් පියවරක්ද ක්‍රියාත්මක කිරීමට.
4. පියවරක් නැවත නැවත ක්‍රියාත්මක කිරීමට.

57)OR ද්වාරයක ප්‍රතිදානය (Output) 1 වීමට නම්, ආදාන (Inputs) මොනවා විය යුතුද?

1. සියලුම ආදාන 0 විය යුතුය.
2. අවම වශයෙන් එක් ආදානයක් හෝ 1 විය යුතුය.
3. සියලුම ආදාන 1 විය යුතුය.
4. සියලුම ආදාන විවිධ අගයන් විය යුතුය.

58) සංඛ්‍යාක පරිගණක වල භාවිතා කරන සංඥා වර්ගය කුමක්ද?

1. ප්‍රතිසම (Analog) සංඥා
2. අංකිත (Digital) සංඥා
3. ප්‍රතිසම සහ අංකිත සංඥා දෙකම
4. රූපමය සංඥා

59)OR ද්වාරයක් නිරූපණය කරන ජල සැපයුම් පද්ධතියක උපමාව කුමක්ද?

1. ජල ටැංකියකට ජලය ලැබෙන එකම කපාටයක් සහිත පද්ධතියක්.
2. නිවසකට ජලය ලැබෙන ප්‍රධාන ජල සැපයුම සහ ජල ටැංකිය කපාට දෙකක් හරහා සමාන්තරව සම්බන්ධ කර ඇති පද්ධතියක්.
3. ජල ටැංකියකින් ජලය බැස යන කපාට දෙකක් සහිත පද්ධතියක්.
4. ජලය ගබඩා කිරීම සඳහා පමණක් භාවිතා කරන ජල ටැංකියක්.

60)ඩිජිටල් පරිපථයක ආදාන සහ ප්‍රතිදාන සාමාන්‍යයෙන් කුමන ආකාරයෙන් නිරූපණය වේද?

1. දශම සංඛ්‍යා ලෙස
2. ද්විමය (Binary) සංඛ්‍යා ලෙස (0 සහ 1)
3. අකුරු ලෙස
4. වර්ණ කේත ලෙස

61)පරිගණකයක් එහි දත්ත සැකසීමේ කාර්යයන් සඳහා භාවිතා කරන මූලික තර්ක ද්වාර මොනවාද?

1. AND, OR, NOT
2. NAND, NOR, XOR
3. XNOR, BUFFER, INVERTER
4. ADDER, SUBTRACTOR, MULTIPLIER

62)අන්තර්ජාලයේ පිවිසෙන විට නිතර භාවිතා කරන වෙබ් පිටු පහසුවෙන් නැවත විවෘත කිරීම සඳහා භාවිතා කරන විශේෂාංගය කුමක්ද?

1. History
2. Bookmark / Favorite
3. New Tab
4. Hyperlink

63)වෙබ් පිටුවක් නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන දේ කුමක්ද?

1. අවශ්‍යතාවය කුමක්ද?
2. භාවිතා කරන්නන් කවුද?
3. සැලැස්ම සහ ව්‍යුහය
4. වෙබ් පිටුවේ ප්‍රමාණය.

64)වෙබ් පිටුවක ඇති පෙළක් තද අකුරින් (Bold) දැක්වීම සඳහා භාවිතා කරන HTML ටැගය කුමක්ද?

1. <i>...</i>
2. ...
3. <h>...</h>
4. <p>

65)වෙබ් පිටුවක අංකිත ලැයිස්තුවක් (Ordered list) ආරම්භ කිරීමට භාවිතා කරන HTML ටැගය කුමක්ද?

1. ...
2. ...
3. ...
4. <list>...</list>

66)වෙබ් පිටු නිර්මාණය කිරීම සඳහා භාවිතා කළ හැකි මෘදුකාංගයක් නොවන දේ කුමක්ද?

1. Notepad
2. NetBeans
3. WordPress
4. Microsoft Excel

67)වෙබ් පිටු අතර ගමන් කිරීම සඳහා භාවිතා වන "Forward" සහ "Backward" බොත්තම් දැකිය හැක්කේ කොහේද?

1. වෙබ් පිටුවේ පහළ කෙළවරේ.
2. වෙබ් පිටුවේ ඉහළ වම් කෙළවරේ.
3. වෙබ් පිටුවේ මැද.
4. වෙබ් පිටුවේ දකුණු කෙළවරේ.

68)වෙබ් පිටුවක් අන්තර්ජාලයට උඩුගත (upload) කිරීමෙන් පසු එය දැකිය හැකි වන්නේ කුමන මෘදුකාංගයකින්ද?

1. වදන් සකසන්
2. පැතුරුම්පත්
3. අතිරික්සුව
4. චායාරූප සංස්කාරකය

69)වෙබ් පිටුවක පෙළක් ඇල අකුරින් (Italic) දැක්වීම සඳහා භාවිතා කරන HTML ටැගය කුමක්ද?

1. …
2. <i>…</i>
3. <h>…</h>
4.

70)ද්විමය (Binary) සංඛ්‍යා පද්ධතියේ භාවිතා කරන සංකේත මොනවාද?

1. 0, 1, 2
2. 0, 1
3. 1, 2
4. 0, 1, …, 9

71)ද්විමය සංඛ්‍යාවක් වන 10111_2 හි දශම අගය කුමක්ද?

1. 21_{10}
2. 23_{10}
3. 25_{10}
4. 27_{10}

72)මනුෂ්‍යයන්ට හුරුපුරුදු සංඛ්‍යා පද්ධතිය කුමක්ද?

1. ද්විමය
2. අෂ්ටක
3. දශම
4. ෂඩ් දශම

73)49_{10} ද්විමය සංඛ්‍යාවට පරිවර්තනය කළ විට ලැබෙන පිළිතුර කුමක්ද?

1. 1011001_2
2. 1100001_2
3. 110001_2
4. 1101001_2

74)ගොනුවක් වෙනත් අයෙකුට සංස්කරණය කිරීම වැලැක්වීම සඳහා භාවිතා කළ හැකි ගොනු ගුණාංගය කුමක්ද?

1. Hidden
2. Read Only
3. System
4. Archive

75)යතුරුපුවරුවක් හෝ මූසිකයක් ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී විසඳුමක් ලෙස පළමුව කළ හැකි සරල පියවර කුමක්ද?

1. පරිගණකය Shutdown කිරීම
2. පරිගණකය Restart කිරීම
3. නව යතුරුපුවරුවක් හෝ මූසිකයක් සම්බන්ධ කිරීම
4. තාක්ෂණික ශිල්පියෙකුගෙන් සහාය ලබා ගැනීම

76)පරිගණකයක "Hidden" ගොනු ගුණාංගය භාවිතා කරන්නේ කුමන කාර්යයක් සඳහාද?

1. ගොනුවේ විශාලත්වය සීමා කිරීමට
2. ගොනුව දර්ශනය වීමෙන් වළක්වා සැඟවීමට
3. ගොනුවට මුරපදයක් දැමීමට
4. ගොනුව පිටපත් කිරීම වැලැක්වීමට

77)පරිගණකයක ගොනු සොයා ගැනීමේදී (file search) භාවිතා කළ හැකි උපකාරක ක්‍රමයක් නොවන දේ කුමක්ද?

1. ගොනුවේ නම (file name)
2. ගොනුවේ දිගුව (file extension)
3. ගොනුවේ අන්තර්ගතය පිළිබඳ විස්තරය
4. ගොනුව සුරකින ලද දිනය (saved date)

78)පරිගණකයේ Task Bar එකේ දකුණු පස පහළ කෙළවරේ ඇති Speech Balloon (කථන බැලුම්) icon එක click කිරීමෙන් විවෘත වන්නේ කුමක්ද?

1. Control Panel
2. File Explorer
3. Windows Action Center
4. Settings

79)පෙළක යම් කොටසක් ඉස්මතු කිරීමට (Highlight) භාවිතා කරන මෙවලම කුමක්ද?

1. Bold
2. Italic
3. Underline
4. Highlight

80)"Superscript" මෙවලම මගින් පෙළක් හැඩතල ගන්වන්නේ කෙසේද?

1. පෙළ සාමාන්‍ය පේළියට පහළින් කුඩා අකුරින් දැක්වීම (උදා: CO_2)
2. පෙළ සාමාන්‍ය පේළියට ඉහළින් කුඩා අකුරින් දැක්වීම (උදා: 2^2)
3. පෙළ සාමාන්‍යයෙන් වඩා විශාල අකුරින් දැක්වීම
4. පෙළෙහි වර්ණය වෙනස් කිරීම

81)වදන් සැකසුම් මෘදුකාංගයක "Shading" මෙවලම භාවිතා කරන්නේ කුමන කාර්යයක් සඳහාද?

1. අකුරු වල වර්ණය වෙනස් කිරීමට
2. අකුරු වල ප්‍රමාණය වෙනස් කිරීමට
3. පෙළ හෝ ඡේදයක පසුබිම් වර්ණය දැක්වීමට
4. පෙළ යටින් ඉරක් ඇඳීමට

82)"Align Right" මෙවලමෙහි කාර්යය කුමක්ද?

1. පෙළ වම් කෙළවරට පෙළගැස්වීම

2. පෙළ දකුණු කෙළවරට පෙළගැස්වීම
3. පෙළ මධ්‍යයට පෙළගැස්වීම
4. පෙළ දෙපසටම පෙළගැස්වීම

83)"Bullets" මෙවලම භාවිතා කරන්නේ කුමන කාර්යයක් සඳහාද?

1. සංඛ්‍යාත්මක ලැයිස්තුවක් සෑදීමට
2. සලකුණු (symbols) සහිත ලැයිස්තුවක් සෑදීමට
3. පෙළෙහි වර්ණය වෙනස් කිරීමට
4. ලේඛනයක් සුරැකීමට

84)Scratch වැඩසටහන්කරණයේදී අගයන් දෙකක් සසඳා බැලීම සඳහා භාවිතා කරන මෙවලම් කොටස් (Comparison blocks) කුමන ප්‍රතිචාරයක් ලබා දෙයිද?

1. සංඛ්‍යාත්මක අගයක්
2. පෙළ අගයක්
3. සත්‍ය (true) හෝ අසත්‍ය (false) ප්‍රතිචාරයක්
4. රූපමය ප්‍රතිචාරයක්

85)"987654321V" යන ජාතික හැඳුනුම්පත් අංකයෙන් උපන් වර්ෂය සොයා ගැනීමේ ගැටලුවේදී, "ක්‍රියාවලිය" (Process) ලෙස දැක්විය හැකි පියවර කුමක්ද?

1. ජාතික හැඳුනුම්පත් අංකය ලබා ගැනීම
2. ජාතික හැඳුනුම්පත් අංකයේ මුල් ඉලක්කම් 02 වෙන්කර ගැනීම
3. උපන් වර්ෂය ප්‍රදර්ශනය කිරීම
4. අංකය පරිගණකයට ඇතුළත් කිරීම

86)"ගැටළු විශ්ලේෂණය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

1. ගැටලුවක් කෙලින්ම විසඳීම.
2. ගැටලුවක් පරීක්ෂාවට ලක්කර සරල කොටස් වලට වෙන් කර ගැනීම.
3. ගැටලුවක් පිළිබඳව අන්තර්ජාලයෙන් තොරතුරු සෙවීම.
4. ගැටලුවක් නොසලකා හැරීම.

87)මාර්ග සිතියම ("Road Map") යෙදුමක (app) ප්‍රධාන කාර්යය කුමක්ද?

1. තරු සහ ග්‍රහලෝක වල පිහිටීම සොයා ගැනීම.
2. GPS භාවිතයෙන් මාර්ග සොයා ගැනීම සහ දුර ගණනය කිරීම.
3. භාෂා පරිවර්තනය කිරීම.
4. QR කේත කියවීම.

88)AND ද්වාරයක ප්‍රතිදානය (Output) 1 වීමට නම්, ආදාන (Inputs) මොනවා විය යුතුද?

1. ඕනෑම එක් ආදානයක් 1 විය යුතුය.
2. සියලුම ආදාන 0 විය යුතුය.
3. එක් ආදානයක් 1 ක් ද අනෙක 0 ක් ද විය යුතුය.
4. සියලුම ආදාන 1 විය යුතුය.

89)තර්ක ද්වාර (Logic gates) පරිගණකයක කුමන කොටසක මූලික ගොඩනැගීමේ ඒකක ලෙස ක්‍රියා කරයිද?

1. මොනිටරයේ
2. යතුරුපුවරුවේ
3. මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU)
4. මුද්‍රණ යන්ත්‍රයේ

90)ඩිජිටල් සංඥාවක "1" යන අගය විවිධ ආකාරයෙන් නිරූපණය කළ හැක්කේ කෙසේද?

1. LOW, FALSE, 0 V
2. HIGH, TRUE, 5 V
3. OFF, FALSE, 0 V
4. LOW, TRUE, 5 V

91)තර්ක ද්වාර සම්බන්ධ කිරීමෙන් නිර්මාණය කරන්නේ කුමක්ද?

1. දත්ත සමුදායන්
2. මෘදුකාංග වැඩසටහන්
3. සරල පරිපථ
4. මෙහෙයුම් පද්ධති

92)පරිගණක දෘඩාංග මට්ටමේදී (Computer hardware level) ද්විමය අගයන් (0 සහ 1) කෙසේ නිරූපණය කළ හැකිද?

1. වර්ණ සංඥා මගින්
2. ශබ්ද සංඥා මගින්
3. වෝල්ටීයතා අගයන් මගින්
4. චලන සංඥා මගින්

93)සෙවුම් යන්ත්‍ර සඳහා උදාහරණයක් නොවන දේ කුමක්ද?

1. Google
2. Yahoo
3. Bing
4. AskAbout

94)වෙබ් පිටු අතර පහසුවෙන් මාරු වීම සඳහා එකම සෙවුම් යන්ත්‍ර කවුළුවක් තුළ වෙබ් පිටු කිහිපයක් විවෘත කිරීමට භාවිතා කරන විශේෂාංගය කුමක්ද?

1. Bookmark
2. History
3. Tabs
4. Full Screen

95)වෙබ් පිටුවක අන්තර්ගතය (content) දැක්වීම සඳහා භාවිතා කරන HTML ටැගය (tag) කුමක්ද?

1. <head>...</head>

2. <title>…</title>
3. <body>…</body>
4. <html>…</html>

96)අන්තර්ජාලයේ "History" විශේෂාංගය මගින් සිදුවන්නේ කුමක්ද?

1. මෑතකදී විවෘත කරන ලද වෙබ් ලිපින ගබඩා කර තබා ගැනීම.
2. නිතර භාවිතා කරන වෙබ් පිටු සුරැකීම.
3. වෙබ් පිටුවක් නිර්මාණය කිරීම.
4. අන්තර්ජාල වේගය වැඩි කිරීම.

97)වෙබ් පිටුවක මාතෘකාව (Title), බ්‍රවුසරයේ ටැබ් එකේ දිස්වීම සඳහා භාවිතා කරන HTML ටැගය කුමක්ද?

1. <head>…</head>
2. <title>…</title>
3. <body>…</body>
4. <h1>…</h1>

98)වෙබ් පිටුවක අනුපිළිවෙලක් නොමැති ලැයිස්තුවක් (Unordered list) ආරම්භ කිරීමට භාවිතා කරන HTML ටැගය කුමක්ද?

1. …
2. …
3. …
4. <list>…</list>

99)වෙබ් පිටුවක් නිර්මාණය කිරීමේදී, "Design" (සැලසුම) යටතේ සලකා බැලිය යුතු කරුණු මොනවාද?

1. වෙබ් පිටුවේ ක්‍රියාකාරීත්වය
2. භාවිතා කරන වර්ණ, අකුරු සහ අකුරු ප්‍රමාණය, කියවීමේ පහසුව සහ පැහැදිලි බව
3. වෙබ් පිටුවේ ආරක්ෂාව
4. වෙබ් පිටුවේ කේතීකරණ භාෂාව

100)අන්තර්ජාලය ඔස්සේ තොරතුරු සෙවීමේදී, "Keyword" (මූල පදය) යනු කුමක්ද?

1. සෙවුම් යන්ත්‍රයකට ඇතුළු කරන, අපට අවශ්‍ය තොරතුරු හා සම්බන්ධ වචනයක් හෝ වාක්‍ය ඛණ්ඩයක්.
2. වෙබ් පිටුවක මාතෘකාව.
3. වෙබ් අඩවියක ලිපිනය.
4. අන්තර්ජාල සම්බන්ධතාවයේ නම.

<<<<<<<<<<< ව්‍යුහගත හා රචනා >>>>>>>>>>

1)යතුරු පුවරුවක් (keyboard) හෝ මූසිකයක් (mouse) ක්‍රියා නොකිරීම මෘදුකාංග ගැටලුවකට (software problem) උදාහරණයකි. (සත්‍ය / අසත්‍ය)

2)PS/2 දම් පැහැති සම්බන්ධකය පරිගණකයට යතුරු පුවරුව සම්බන්ධ කිරීම සඳහා භාවිතා කරයි. (සත්‍ය / අසත්‍ය)

3)සංදර්ශකය සහ පරිගණකය සම්බන්ධ කිරීම සඳහා USB සම්බන්ධකය භාවිතා කළ හැකිය (සත්‍ය / අසත්‍ය)

4)පරිගණකයට ලබා දෙන සියලුම ආදාන (input) පරිගණකය තුළ ද්විමය ආකාරයෙන් ගබඩා වේ. (සත්‍ය / අසත්‍ය)

5)වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් ලේඛනයක අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ පරීක්ෂා කළ නොහැක. (සත්‍ය / අසත්‍ය)

6)IF...THEN...ELSE යනු Scratch මෘදුකාංගයේ තේරීම් පාලන ව්‍යුහයක් සඳහා උදාහරණයකි. (සත්‍ය / අසත්‍ය)

7)HDMI සම්බන්ධකය මගින් ශ්‍රව්‍ය (audio) සහ දෘශ්‍ය (video) ආදාන සහ ප්‍රතිදාන සිදු කළ නොහැක. (සත්‍ය / අසත්‍ය)

8)වෙබ් බ්‍රව්සරයක් යනු යෙදුම් මෘදුකාංගයකි. (සත්‍ය / අසත්‍ය)

9)Scratch යනු වැඩසටහන්කරණය (programming) පහසු කිරීම සඳහා නිර්මාණය කරන ලද නොමිලේ සහ විවෘත මූලාශ්‍ර දෘශ්‍ය වැඩසටහන්කරණ භාෂාවකි. (සත්‍ය / අසත්‍ය)

10)පරිගණකයක් මන්දගාමී වීම මෙහෙයුම් පද්ධතියේ දෝෂයකට උදාහරණයකි. (සත්‍ය / අසත්‍ය)

11)ගොනුවක නම හෝ ගබඩා කළ ස්ථානය අමතක වූ විට එම ගොනුව සොයා ගැනීමට ගොනු සෙවීමේ (file search) විශේෂාංගය භාවිතා කළ හැකිය. (සත්‍ය / අසත්‍ය)

12)Windows මෙහෙයුම් පද්ධතියට අනුකූල මෘදුකාංග Mac මෙහෙයුම් පද්ධතියට ද සෑම විටම අනුකූල වේ. (සත්‍ය / අසත්‍ය)

13)පැරණි මුද්‍රණ යන්ත්‍ර (printers) පරිගණකයට සම්බන්ධ කිරීම සඳහා Parallel port බහුලව භාවිතා කරන ලදී. (සත්‍ය / අසත්‍ය)

14)පරිගණකයක Desktop icons නොපෙන්වීමට Tablet Mode සක්‍රිය වී තිබීම එක් හේතුවක් විය හැකිය. (සත්‍ය / අසත්‍ය)

15)පරිගණක වෛරසයක් මගින් ඇතිවන ගැටලු විසඳීම සඳහා Anti-virus මෘදුකාංගයක් භාවිතා කළ හැකිය. (සත්‍ය / අසත්‍ය)

16)ගැටළුවක් විශ්ලේෂණය කිරීමේදී, "ආදානය" යනු ගැටළුව විසඳීමට අවශ්‍ය දත්ත හෝ තොරතුරු වේ. (සත්‍ය / අසත්‍ය)

17)HTML වල <body> ටැගය (tag) වෙබ් පිටුවේ මාතෘකාව (title) දැක්වීමට භාවිතා කරයි. (සත්‍ය / අසත්‍ය)

18)වදන් සැකසුම් මෘදුකාංගයක "Redo" (නැවත කරන්න) විශේෂාංගය මගින් කලින් අවලංගු කළ (Undo) ක්‍රියාවක් නැවත සිදු කළ හැකිය. (සත්‍ය / අසත්‍ය)

19)Windows මෙහෙයුම් පද්ධතියේ "Disk Cleanup" (තැටි පිරිසිදු කිරීම) මෙවලම භාවිතයෙන් පරිගණකයේ අනවශ්‍ය ගොනු ඉවත් කළ හැක (සත්‍ය / අසත්‍ය)

20)පරිගණක ජාලයකදී RJ45 සම්බන්ධකය භාවිතා කරන්නේ මුද්‍රණ යන්ත්‍රයක් (printer) සම්බන්ධ කිරීමටය. (සත්‍ය / අසත්‍ය)

21). Google, Yahoo, Bing, Ask, MSN යනු වෙබ් අතිරික්සු සඳහා උදාහරණ වේ. (සත්‍ය / අසත්‍ය)

22)SD card reader ලැප්ටොප් (Laptop) සහ ටැබ්ලට් (Tablet) වැනි උපාංගවල දැකිය හැකිය. (සත්‍ය / අසත්‍ය)

23)HTML වෙබ් පිටුවක පින්තූරයක් ඇතුළු කිරීමට <a> ටැගය භාවිතා කරයි. (සත්‍ය / අසත්‍ය)

24)පරිගණක වෛරසයකට පරිගණක පද්ධතියට හානි කිරීමට, දත්ත විනාශ කිරීමට සහ නැවත ප්‍රතිනිර්මාණය වීමට (replicate) හැකියාව ඇත. (සත්‍ය / අසත්‍ය)

25)ඩිජිටල් සංඥා නිරූපණය කළ හැක්කේ 0 සහ 1 යන අගයන් මගින් පමණි.

(සත්‍ය / අසත්‍ය)

26)සංඛ්‍යා පද්ධතියක "පාදය" (base) යනු එම සංඛ්‍යා පද්ධතියේ ඇති විවිධ සංකේත ගණනයි. (සත්‍ය / අසත්‍ය)

27)දශමය සංඛ්‍යාවක් ද්විමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කිරීමේදී එම සංඛ්‍යාව 2න් බෙදා ඉතිරි (remainder) කොටස ඉහළ සිට පහළට ලියාගනු ලැබේ.(සත්‍ය / අසත්‍ය)

28)පරිගණකයකට ඇතුළු කරන සියලුම දත්ත (text, image, sound, video) පරිගණකය තුළ ද්විමය (binary) ආකෘතියෙන් ගබඩා වේ. (සත්‍ය / අසත්‍ය)

29)Scratch යනු ක්‍රමලේඛනය පහසු කිරීම සඳහා නිර්මාණය කරන ලද වාණිජමය (commercial) දෘශ්‍ය ක්‍රමලේඛන භාෂාවකි. (සත්‍ය / අසත්‍ය)

30)VGA, DVI, HDMI යනු සංදර්ශකයක් (monitor) පරිගණකයට සම්බන්ධ කිරීම සඳහා භාවිතා කළ හැකි සම්බන්ධක (connector) වර්ග වේ. (සත්‍ය / අසත්‍ය)

31)1011_2 ද්විමය සංඛ්‍යාවට සමාන දශමය සංඛ්‍යාව කුමක්ද?...

32) පරිගණක ගොනුවක ගුණාංග දෙකක් ලියන්න.

*..

*..

33)මූසිකය ක්‍රියා නොකරන විට, ගැටළුව විසඳීම සඳහා ගත හැකි එක් පියවරක් ලියන්න

*...

34)HTML කේතකරණයේදී <p> ටැගය භාවිතා කරන්නේ කුමක් සඳහාද?

*...

35)ගැටළුවක් විසඳීමේදී ඇල්ගොරිතමයකට අවශ්‍ය මූලික පියවර තුන කුමක්දැයි සඳහන් කරන්න.

*...

36)පරිගණක ජාලකරණය සඳහා භාවිතා කරන කේබල් සම්බන්ධකය කුමක්ද?
*...

37)මූසිකය සහ යතුරුපුවරුව පරිගණකයට සම්බන්ධ කිරීම සඳහා PS/2 සම්බන්ධකයට අමතරව භාවිතා කළ හැකි තවත් සම්බන්ධක වර්ගයක් නම් කරන්න.*...

38)යෙදුම් මෘදුකාංග (Application software) වර්ග දෙකක් නම් කරන්න.

*..

*..

39)පරිගණක වෛරසයක් යනු කුමක්දැයි කෙටියෙන් අර්ථ දක්වන්න.*...
....
....

40)HTML කේතකරණයේදී වෙබ් පිටුවකට රූපයක් ඇතුළත් කිරීම සඳහා භාවිතා කරන ටැගය කුමක්ද?
*...

41)පරිගණකයක ගොනුවක් සෙවීමට (File Search) උපකාරී වන ගොනු ගුණාංග දෙකක් නම් කරන්න.*...
....

42)පරිගණකයක සුරැකූ ගොනුවක් පසුව නැවත විවෘත කිරීමට අවශ්‍ය වූ විට එම ගොනුවේ නම හෝ සුරැකූ ස්ථානය අමතක වූ විට, එම ගොනුව සොයා ගැනීම සඳහා ....භාවිතා කළ හැක

43)වෙබ් පිටුවකට රූපයක් ඇතුළත් කිරීම සඳහා HTML හි _______________ ටැගය භාවිතා වේ

44)OR තාර්කික ද්වාරයක අවම වශයෙන් එක් ආදානයක් 1 වන විට ප්‍රතිදානය __ වේ

45)දම් පැහැති PS/2 සම්බන්ධකය භාවිතා කරන්නේ පරිගණකයට ______සම්බන්ධ කිරීම සඳහාය.

46)පරිගණක ජාලකරණය සඳහා භාවිතා කරන සම්බන්ධකය ________ වේ.

47)මෙහෙයුම් පද්ධතියක් යනු _______________මෘදුකාංගයකි

***43-47 සඳහා[<a href="">, 0, 1, යෙදුම්, <img src="", RJ45, පද්ධති, මූසිකය, යතුරු පුවරුව]**

48)



49)වෙබ් පිටුවක් නිර්මාණය කිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු මොනවාදැයි පැහැදිලි කර, HTML කේතකරණයේදී බහුලව භාවිතා වන ටැග් (tags) පහක් විස්තර කරන්න.*..
....
....
....
....
....
....
....
....
....

50)ඇල්ගොරිතමයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න. ඇල්ගොරිතම ගොඩනැගීමේදී භාවිතා වන ප්‍රධාන පාලන ව්‍යුහයන් සඳහා සුදුසු ගැලීම් සටහන් අදින්න.

PS/2 කෙවෙනිය

VGA කෙවෙනිය

DVI කෙවෙනිය

දම් - යතුරු පුවරුව
කොළ - මූසිකය

HDMI කෙවෙනිය

USB කෙවෙනිය

RJ45 කෙවෙනිය



eSATA කෙවෙනිය

HD Audio කෙවෙනිය

Display Port

Parallel කෙවෙනිය

Micro USB කෙවෙනිය

SD Card Reader